## ජේ.ආර්. ජයවර්ධන ඓතිහාසික පර්යේෂණ, ලෙඛනාගාර හා පුස්තකාල මධ්‍යස්ථානය - 2012

1 **මූල්‍ය ප්‍රකාශන**

1:1 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ජේ.ආර්. ජයවර්ධන ඓතිහාසික පර්යෙෂණ, ලේඛනාගාර හා පුස්තකාල මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය ශ්‍රි ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

1.2.1 **ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති.**

**ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 01**

යථෝක්ත ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව මූල්‍ය ප්‍රකාශන කට්ටලය සමඟ ඉදිරිපත් කළයුතු ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර, මූල්‍ය ප්‍රකාශනයන්හි නිසි ලෙස සංරචකයන් හඳුන්වාදී නොතිබුණි. එමෙන්ම ඡේද අංක 21 (ඉ) යටතේ කළ අයවැයගත සංඛ්‍යා තථ්‍ය සංඛ්‍යා සැසඳීමේ ඉදිරිපත් කර නොතිබුණි.

1:2:2 **ගිණුම්කරණ ප්‍රතිපත්ති**

2000 හා 2002 වර්ෂවල සිට ප්‍රමුඛ බැංකුවේ ආයෝජනය කර තිබුණු එකතුව රු.9,725,000 ක් සඳහා 2012 දෙසැම්බර් 05 දින මෙම ආයතනයට ලැබී තිබුණු ණයකර සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනයේ හෙළිදරව් කර නොතිබුණු අතර 2004 වර්ෂයේ සිට ලැබිය යුතු පොලියද මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

1.2.3 **ගිණුම්කරණ අඩුපාඩු**

මධ්‍යස්ථානය සතු ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම වෙන වෙනම තක්සේරුකර ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ඉඩම් සඳහාද සියයට පහක ක්ෂය ප්‍රතිපාදන සලසා තිබුණි.

1.2.4 **නොසැසඳූ පාලන ගිණුම්**

2011 වර්ෂයට අදාළව සංචිත හා අතිරික්ත ගිණුමේ ශේෂය රු.32,294,360 ක් වුවද, ආදායම් හා වියදම් ප්‍රකාශනයේ එම අගය රු.32,977,609 ක් ලෙස පෙන්නුම් කර තිබුණි.

1.2.5 **විගණනය සඳහා සාක්ෂි නොවීම.**

එකතුව රු.1,005,395 ක උපචිත වියදම පිළිබඳ ජර්නල් සටහන, ජර්නල් ලේඛනයේ සටහන් කර නොතිබුණු අතර අදාල ජර්නල් වවුචරයද විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

1:2:6 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති,රීති,රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1988 අංක 77 දරන ජේ.ආර් ජයවර්ධන මධ්‍යස්ථානය පනත | |
| (i) 1 වගන්තිය | පනත අනුව මධ්‍යස්ථානයේ නාමය "ජේ.ආර් ජයවර්ධන ඓතිහාසික පර්යේෂණ, ලේඛනාගාර හා පුස්තකාල මධ්‍යස්ථානය" වුවද, මූල්‍ය ප්‍රකාශයන්හි "ජේ.ආර් ජයවර්ධන මධ්‍යස්ථානය" ලෙස හා මධ්‍යස්ථානය භාවිතා කරනු ලබන ලිපි ශීර්ෂයන්හි "ජයවර්ධන සංස්කෘතික කේන්ද්‍රය" ලෙස ද භාවිතා කර තිබුණි. |
| (ii) 3 (ඒ) වගන්තිය | 2009 ජනවාරි 25 දිනට පාලක සභා සාමාජිකයින් දෙදෙනෙකුගේ ධූර කාලය අවසන්වී තිබුණු අතර 2012 සැප්තැම්බර් 18 දින වන විට පාලක මණ්ඩලය පත්කර තිබුණත් 2012 වර්ෂය සඳහා පාලක සභා රැස්වීම් පවත්වා නොතිබුණි. |
| (ආ) ආයතන සංග්‍රහයේ xix පරිච්ඡේදය 5:3:1 ඡේදය සහ 5:8 ඡේදය | 2012 අගෝස්තු මස සිට මධ්‍යස්ථානයේ නිල නිවස ලේකම් ජනරාල්වරයාගේ පදිංචියට ලබා දී තිබුණත් ඒ සඳහා කුලී ගාස්තු අයකර නොතිබුණු අතර නිල නිවස සඳහා ජල හා විදුලි ගාස්තු මධ්‍යස්ථානය විසින් ගෙවීම් කර තිබූ නමුත් එම ගාස්තු අදාළ නිළධාරියාගෙන් අයකර ගෙන නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක පිඊ/ඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු. 573,779 ක අතිරික්තයක් වූ අතර, ඉකුත් වර්ෂයේ ඊට අනුරූපීව අතිරික්තය රු. 1,204,230 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 630,451 ක පිරිහීම සඳහා අළුත්වැඩියා සහ සැපයුම් වියදම් පිළිවෙලින් රු. 2,348,467 ක් හා රු.345,633 ක් වැඩිවීමද ස්ථාවර තැන්පත් පොළි රු.1,790,078 කින් වැඩිවීමද විශේෂයෙන් බලපා තිබුණි.

### 2:2. විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පසුගිය වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.630,451 කින් එනම් සියයට 52 කින් අඩු වී තිබුණි. ප්‍රධාන ආදායම් හා වියදම් විචලනයන් පහත දැක්වේ.

| | | 2012 | 2011 | විචලනය | විචලනයේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | සයයට |
| ආදායම් | ස්ථාවර තැන්පත් පොළී | 8,984,315 | 7,194,237 | 1,790,077 | 25 |
| | විවිධ ලැබීම් | 105,107 | 29,900 | 75,207 | 252 |
| වියදම් | | | | | |
| | සැපයුම් වියදම් | 2,920,896 | 2,575,263 | 345,633 | 13 |

| | | | | |
|---|---|---|---|---|
| අළුත්වැඩියා හා නඩත්තු වියදම් | 3,732,279 | 1,383,812 | 2,348,467 | 170 |

3 **<u>මෙහෙයුම් සමාලෝචනය</u>**

3.1 <u>මතභේදයට තුඩුදෙන ගනුදෙනු</u>

1994 ජුනි මස 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව, භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ලේකම් ජනරාල්වරයාගේ අනුමැතියෙන් පමණක් විශේෂ දීමනා ලෙස මධ්‍යස්ථානයේ ස්ථිර කාර්ය මණ්ඩලයේ 27 දෙනෙකුට රු.131,500 ක්ද තාවකාලික කාර්ය මණ්ඩලයේ තිදෙනෙකුට රු.6,500 ක් හා බාහිර පාර්ශවයක් වන ආරක්ෂක අංශය වෙත රු.7,500 ක්ද, 2012 දෙසැම්බර් මාසයේදී ගෙවීම්කර තිබුණි.

3.2 <u>හඳුනාගන්නා ලද පාඩු</u>

2012 ඔක්තෝබර් 30 දින ලදුපත් අංක 2523 මගින් ලැබුණු රු.49,020 ක් මුදල් පොතේ රු.47,020 ක් ලෙස සටහන් කර තිබූ අතර රු.2,000 ක් අඩුවෙන් බැංකු ගත කර තිබුණි.

3.3 <u>සේවක පාර්තෝෂිත සඳහා ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදලක් ගොඩනැගීම.</u>

සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,185,097 ක් වූ පාර්තෝෂිත ප්‍රතිපාදනය වෙනුවෙන් ආයෝජනය කර නොතිබුණි.

4 <u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>

4.1 <u>සංයුක්ත සැලැස්ම.</u>

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාර මධ්‍යස්ථානයේ දර්ශනය හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි.

4.2 <u>ක්‍රියාකාර සැලැස්ම</u>

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4.3 **<u>ප්‍රසම්පාදන සැලැස්ම</u>**

2012 වර්ෂය සඳහා රු.4,864,664 ක ජංගම නොවන වත්කම් මිලදී ගෙන තිබුණද, ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4.4 **<u>අයවැය පාලනය</u>**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව 2012 වර්ෂය සඳහා අයවැය ලේඛනයක් සකස් කර නොතිබුණි.

4.5 **<u>වාර්ෂික වාර්තා සභාගත කිරීම</u>**

2002යෙන් පසුව මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි.

4.6 **<u>නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ</u>**

2012 සැප්තැම්බර් 19 දින පවත්වන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබා දී තිබුණු නියෝගය අනුව පාලිත සමාගමක රු. මිලියන 5ක් ආයෝජනය කිරීම සම්බන්ධව වාර්තාවක් විගණනය වෙත මසක් ඇතුළත ලබාදිය යුතු බව නියෝග කර තිබුණත් 2013 ඔක්තෝබර් වන විටත් ඒ පිළිබඳ කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

5 **<u>පද්ධති හා පාලනයන්</u>**

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර විගණන විමසුම් මගින් ලේකම් ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) මුදල් හා බැංකු

(ආ) අළුත්වැඩියා හා නඩත්තු